උපදෙස් පත්‍රිකා අංක 2013/10

# රබර් ආශ්‍රිත ගොවි කර්මාන්ත




ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

# රබර් ආශ්‍රිත ගොවි කර්මාන්ත

රබර් ආශ්‍රිත ගොවි කර්මාන්ත වන රබර් වගා කරන ඉඩම් වල ඒකාබද්ධ බෝග හා සත්ව පාලනය රබර් වගා කරුවන්ට අතිරේක ආදායමක් ගෙන දීමට ඉවහල් වේ.

නමුත් බොහොමයක් බෝග රබර් සමග වගා කළ හැකි වුවත්, කුමන බෝගයක් සුදුසු ද යන්න රඳා පවතින්නේ රබර් ශාකයේ වර්ධන අවධිය මතයි. රබර් ශාකයේ විවිධ වර්ධන අවධීන්ට සුදුසු බෝග වගුව 1 හි සාරාංශ කොට ඇත. කෙසේවුවද බෝග තෝරා ගැනීමේදී වෙළඳපොළ තත්ත්වය, සම්පත් සුලභතාවය හා ඉඩම් යෝග්‍යතාවය ආදී කරුණු ද සැලකිල්ලට ගත යුතුය.

**වගුව 1.** ***විවිධ වර්ධන අවස්ථා වලදී රබර් සමග වගා කිරීමට සුදුසු බෝග***

| **රබර් වගාවේ අපරිණත අවධිය** | **රබර් වගාවේ ජීවන චක්‍රය පුරා** | | **රබර් වගාවේ පරිණත අවධිය** |
|---|---|---|---|
| | **ඒකක බිම් ප්‍රදේශයක ඇති රබර් ගස් සංඛ්‍යාව වෙනස් නොකර** | **ඒකක බිම් ප්‍රදේශයක ඇති රබර් ගස් සංඛ්‍යාව වෙනස් කර** | |
| - කෙසෙල්<br>- අන්නාසි<br>- වැල්දොඩම්<br>- උක්<br>- වාර්ෂික හා කන්න බෝග<br>- ඖෂධ පැළෑටි | - කෝපි<br>- කොකෝවා | - තේ<br>- කුරුඳු<br>- ගම්මිරිස් | - කරදමුංගු<br>- වැනිලා<br>- වේවැල්<br>- ඇන්තූරියම් |

**රබර් වගාවේ අපරිනත අවධියේ වැවිය හැකි බෝග**

හිරු එළිය සඳහා ඔරොත්තු දෙන කෙටිකාලීනව ඵල දරන බෝග මේ සඳහා සුදුසු වන අතර රබර් වගාව ස්ථාපනය සඳහා මිටර $2.4 \times 8.1$ ($8' \times 27'$) පරතරයන් යොදා ගැනීම වඩා උචිත වේ.

***කෙසෙල්***

ලංකාවේ බොහෝ ප්‍රදේශ වල රබර් සමග අතුරු වගාවක් ලෙස ජනප්‍රිය වී ඇති බෝගයකි. එයට හේතුව වී ඇත්තේ

- දේශිය වෙළඳපොළේ ඇති ඉල්ලුම
- අවම පෝෂක අවශ්‍යතාව, කම්කරු අවශ්‍යතාව සහ රෝපණ ද්‍රව්‍ය සුලභ වීම
- වගාව පිළිබඳ ගොවීන් සතු දැනුම සහ අත්දැකීම් බහුල බව

මෙය රබර් වගාවේ මුල් අවුරුදු තුන හතර තුලදී සාර්ථකව වගා කළ හැකි අතර හොඳින් ජලය බැස යන උදාසීන (pH 7.0) පසක් වඩාත් යෝග්‍ය වේ. තද සුළං පවතින ස්ථාන මෙම වගාව සඳහා සුදුසු නොවේ.

*වගාකළ හැකි ප්‍රභේද*


| | |
|---|---|
| ඇඹුල් | බහුලවම වගා කරන ප්‍රභේදය වේ. නමුත් දේශිය වෙළඳ පොළේ සාපේක්ෂව ඉහළ මිලක් නොමැත. |
| කෝලිකුට්ටු | තත්ත්වයෙන් උසස් ප්‍රභේදයකි. වඳ පිදීම සහ පැනමා වැනි රෝගවලට පාත්‍ර වීමේ ප්‍රවණතාව ඉහළ වේ. මෙම ප්‍රභේදය තෙත් කලාපයට නිර්දේශ කර නොමැත. |
| ආනමාළු/ඇම්බුන් | තෙත් ප්‍රදේශවලට වඩාත් සුදුසු වේ. |
| අළු කෙසෙල් | වියළි දේශගුණික තත්ත්ව වලට හිතකර වේ. |

**ක්ෂේත්‍රයේ සිටවීම**


මීටර 2.4 × 8.1 වන රබර් පේළි 2ක් අතර කෙසෙල් පේළි එකේ (1) සිට තුන (3) දක්වා වගා කළ හැකිය. (රූපය 1)

***රබර්/කෙසෙල් සිටවීමේ දළ ක්ෂේත්‍ර සටහන***

***රබර් පේළි දෙකක් අතර කෙසෙල් පේළි දෙකක් වන සේ***




***රබර් පේළි දෙකක් අතර කෙසෙල් පේළි තුනක් වන සේ***



කෙසෙල් ප්‍රභේදය අනුව පේලියක ගස් දෙකක් අතර පරතරය වෙනස් වේ.

**කෝලිකුට්ටු** 2.4m (8′), **ඇඹුල්** 3.0m (10′), **ආනමාළු** 3.6m (12′) සහ **ඇම්බුන්** 3.6m (12′)

වගාවේ පඳුරු පාලනය ඉතා වැදගත් වන අතර කෙසෙල් පඳුරක් තුල ගස් තුනක් තිබෙන පරිදි නඩත්තු කල යුතු වේ. උදා. මව් ශාකය සහ වෙනස් වර්ධන අවස්ථාවේ ඇති මොරෙයියන් දෙකක් ලෙස.

***අන්නාසි***

රබර් වැවෙන සියළුම ප්‍රදේශවල අන්නාසි අතුරු බෝගයක් ලෙස වගා කළ හැකි වුවද, වෙළඳපොල පහසුකම් අනුව ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කවලට පමණක් මෙය සීමාවී ඇත. අන්නාසි ආර්ථික වශයෙන් ලාභ ලැබිය හැකි බෝගයක් වුවත් මූලික ස්ථාපනයට අධික ප්‍රාග්ධනයක් සහ අධික කම්කරු ශ්‍රමයක් අවශ්‍ය වේ. වල්පැළෑටි වලින් තොරව වගාව පැවතිය යුතු බැවින් තැනිතලා හෝ මඳ තැනිතලා බිම් යෝග්‍ය වන අතර ආම්ලික (pH 5.5) වැලිලෝම පස සහ ලැටරික් පස අන්නාසි වගාවට සුදුසු වේ.


*වගාකළ හැකි ප්‍රභේද*

**මුරුසි** (නැවුම් පලතුරක් ලෙස ජනප්‍රිය ය)
**කිව්** (විශේෂයෙන් ටින් කිරීමට සුදුසු ය).

*ක්ෂේත්‍රයේ සිටවීම*

මධ්‍යයයේ මිටර 1.5 පරතරයක් ඇතිව ද්විත්ව පේළියට අන්නාසි වගා කළ හැක (කවරයේ රූපය 2). ද්විත්ව පේළියට වගා කිරීමේදි පේළි දෙකක් අතර සෙ.මි. 60 පරතරයක්ද, මොරෙයියන් දෙකක් අතර පරතරය සෙ.මි. 30 - 45 ද වේ. අන්නාසි සිටවීමට කාණු පිළියෙල කිරීමේදි කාණුවක් සෙ.මි. 20 ක් පළලින් හා ගැඹුරින්ද විය යුතු වේ.

*රබර් අන්නාසි සිටවීමේ දළ ක්ෂේත්‍ර සටහන*




R - රබර් R - අන්නාසි

*වැල්දොඩම්*

විවිධ දේශගුණික තත්ත්ව යටතේ වැල් දොඩම් හොඳින් වැඩෙන නමුත් අතරමැදි සහ වියළි කලාපයේ වවන්නේ නම් වියළි කාල වලදි ජලය සැපයිය යුතු වේ. හොඳින් ජලය බැස යන

pH 6.0  - 7.5 වන පස වඩාත් සුදුසු වේ. මෙරට වෙළඳපොලේ මිල ඉතා  සිඝ්‍රයෙන් වෙනස්වන බැවින් විශාල වශයෙන් වගාකරන්නේ නම් වැල්දොඩම් ටින් කිරීමේ කර්මාන්තශාලා සමග සම්බන්ධ වී වගා කිරීම ඉතා නුවණට හුරු වේ.

### *වගාකළ හැකි ප්‍රභේද*


පහත රට තෙත් කලාපයේ රබර් සමග වගා කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රභේද දෙකක් නිර්දේශ කර ඇත. සාම්ප්‍රදායික ‘‘කහ පාට’’ ප්‍රභේදය තෙත් සහ වියළි ප්‍රදේශයන් දෙකටම සුදුසු වන අතර **‘මානි’ ප්‍රභේදය** තෙත් කලාපයට පමණක් සුදුසු වේ.

### *ක්ෂේත්‍රයේ සිටවීම*


රබර් පේළි දෙකක් 2.4 m × 8.1 m අතර වැල්දොඩම් පේළියක් සිටවීම ප්‍රචලිත මුත් වැල්දොඩම් පේළි දෙකක් වුවද සිටවිය හැක (රූපය 3). පේළියක වැල් දෙකක් අතර පරතරය මිටර 4.5 ද පේළි දෙකක් අතර පරතරය මිටර 2 ද විය යුතු වේ. සිටවන වලක් සෙ.මි. 60 × 60 × 60 විය යුතු වන අතර සිටුවීමට සති දෙකකට  පෙර කාබනික ද්‍රව්‍ය සහ මතුපිට පස් වලින් පිරවිය යුතු වේ.

රබර් වැල්දොඩම් සිටවීමේ දළ ක්ෂේත්‍ර සටහන

***රබර් පේළි දෙකක් අතර වැල්දොඩම් පේළියක් වන සේ***




***රබර් පේළි දෙකක් අතර වැල්දොඩම් පේළි දෙකක් වන සේ***




මීටර් දෙකක් පමණ උස්වූ කණු සහ ගැල්වනයිස් කම්බි වලින් යුක්ත ශක්තිමත් ආධාරකයක් මත වැල් වර්ධනය වීමට ඉඩ සලසා දිය යුතුය. ආධාරකය දක්වා වැටුන  වැලෙහි ප්‍රතිවිරුද්ධ දිශාවලට යන අතු දෙකක් පමණක් වැඩීමට ඉඩ සැලසිය යුතු  අතර ඒවාද මීටර දෙකක් වැඩුණු පසු, ද්විතියික අංකුර වැඩීමට සැලසිය යුතු වේ. එම අතු වල පහුරු ඉවත් කර පහළට වැඩීමට සැලසිය යුතු වේ.

***උක්***

වියළි ප්‍රදේශ සඳහා සුදුසු බෝගයක් වන අතරම හොඳ වෙළඳපොලක් ඇති බැවින් මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රචලිත වගාවකි. මෙය රබර් ළපටි අවස්ථාවේ අධික සූර්ය රශ්මියෙන් සහ තාපයෙන් ආරක්ෂා කරන අතරම වර්ධන වේගයද වැඩි කරයි. උක් පර්යේෂණායතනය මගින් නිර්දේශිත සියළුම උක් ප්‍රභේද රබර් සමග වැවිය හැක. රබර් පේළි දෙකක් අතර මීටර 1.2 පරතරයට උක් පේළි හතරක් හෝ පහක් වගා කළ හැක (කවරයේ රූපය 4).

**රබර්/උක් සිටවීමේ දළ ක්ෂේත්‍ර සටහන**




R- රබර්  S- *උක්*

*වාර්ෂික සහ කන්න (සෘතු) බෝග*

බොහොමයක් බෝග රබර්වල ළපටි අවස්ථාවේදී වගා කළ හැක. දේශගුණික සාධක සහ වෙළඳපොල තත්වය අනුව සුදුසු බෝග හඳුනාගත යුතු වේ. මෙරට අතරමැදි  කලාපයේ කන්න බෝග ලෙස කව්පි, කුරක්කන්, බඩඉරිගු, වම්බටු, ගොඩ වී  රබර්  සමග අතුරු වගාවක් ලෙස යොදා ගැනේ (කවරයේ රූපය 5). රබර්/කෙසෙල්/වම්බටු වගාව තෙත් කලාපයෙත් ප්‍රචලිත අතුරු වගාවකි. විශේෂිත දේශගුණික සාධක බලපාන බැවින් තෙත් සහ වියළි කලාපවල බෝග මාරුව සැමවිටම කළ නොහැක.  උදාහරණ වශයෙන් කව්පි වැනි රනිල බෝග තෙත් කලාපයේ වගා කළ විට කරල් වලට දිලීර ආසාදන ඇතිවන බැවින් සාර්ථක නොවීම දැක්විය හැක.


***ඖෂධ පැළෑටි වගාව***

මීට අමතරව කෙටි කාලීන ඖෂධ පැළෑටි වගාව කෙරෙහිද අවධානය යොමුවී ඇත (කවරයේ රූපය 6).

| **ඖෂධ පැළෑටි** | **ප්‍රචාරණය** | **සෙවණ** |
|---|---|---|
| පොල්පලා (*Aerva lanata*) | බීජ මගින් | සූර්යාලෝකය උපරිමව |
| කටුවැල් බටු (*Solanum virginianum*) | බීජ මගින් | සූර්යාලෝකය උපරිමව |
| තිප්පිලි (*Piper longum*) | අතු මගින් | සෙවණ 50% |
| නිල්අවරිය (*Indigofera tinctoria)* | බීජ මගින් | මඳ සෙවන |
| රත්නිතුල් (*Plumbago indica)* | අතු මගින් | මද සෙවන |

රබර් වැවු පළමු වසර තුල බෝග දෙක අතර පරතරය 1.2m ලෙස පවත්වා ගැනිම ප්‍රමාණවත් නමුත් රබර් වගාවේ වියන වර්ධනය හේතුවෙන් මෙම පරතරය වසරින් වසර මීටර 0.6 බැගින් වැඩි කළ යුතු වේ.

රබර්/වාර්ෂික සහ කන්න (සෘතු) බෝග සිටවීමේ දළ ක්ෂේත්‍ර සටහන




y - *වාර්ෂික සහ කන්න (සෘතු) බෝග*

***x* - පළමු වසර *4’(1.2m)***
**- දෙවන වසර 6’(1.8m)**

***වෙනත් සුදුසු බෝග***

රබර් අපරිණත අවධියේ සාර්ථකව වැවෙන පැඟිරිමානා ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ පුළුල්ව වගා කරන ආර්ථික බෝගයක් වන අතරම නොමේරූ රබර් සමග ද වැවිය හැක. කෙසේවුවද මෙම ප්‍රදේශ වල දිර්ඝ කාලයක් තිස්සේ පැගිරි වගා කිරිම නිසා එම නිෂ්පාදනය ඉතාමත් අඩු වි ඇත. එබැවින් පැගිරි තෙල් වලින් පමණක් ආදායමක් බලාපොරොත්තු නොවි ඒ සමග රබර් වගා කර සරු ආදායමක් ලබා ගැනිමට වගාකරුවන් පෙළඹී ඇත.

**රබර් වගාවේ පරිණත අවධියේ වැවිය හැකි බෝග**

රබර් වගාවේ වර්ධන අවස්ථාව අනුව  බෝග තේරිමේදි සැලකිය යුතු කරුණු දෙකකි.

- සෙවණට ඔරොත්තු දෙන බෝගයක් වීම
- පරිණත වු රබර් වගාවේ මුල පද්ධතිය සමග තරග කිරිමට ඇති හැකියාව

**කරදමුංගු**

වර්ෂාපතනය  මි.මි. 1500 - 2500 දක්වා පැතිරුණු ශිත දේශගුණයක් සහිත ප්‍රදේශ වල වගා කරනු ලබන බෝගයකි. එනමුත් පහතරට තෙත් කලාපය  සඳහා යෝග්‍ය කරදමුංගු ප්‍රභේද නිෂ්පාදනය කර ඇති බැවින් රබර් සමග වගා කිරිම සඳහා මෙම ප්‍රභේද යොදා ගත යුතු වේ. කාබනික ද්‍රව්‍ය බහුල, හොඳින් ජලය බැස යන පසක් සුදුසු වේ.


*ප්‍රභේද*

EC1/100, EC1/101, EC1/102 සහ EC2/400MT යන ප්‍රභේද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර ඇත.

***ක්ෂේත්‍රයේ සිටවිම***

රබර් පේළි දෙකක් අතර පරතරය  මිටර $2.4 \times 8.1$ වන්නේ නම්, කරදමුංගු පේළි දෙකක් හෝ තුනක් සිටවිය හැක. දෙපේළි ක්‍රමයේදි පේළිය තුල පරතරය මිටර 1.4 වන අතර පේළි අතර මිටර 2.4 පරතරයක් තබා ගත යුතුය. කරදමුංගු පේළි තුනක් සිටවන්නේ නම් මේ පරතරය වනුයේ ගස් අතර මිටර 1.8 ක් සහ පේළි තුල මිටර 2.4 ක් විමය. සිටවන වලක් සෙ.මි. $40 \times 40 \times 40$  විය යුතු අතර කාබනික ද්‍රව්‍ය සහ මතුපිට පස් වලින් පිරවිය යුතු වේ.

***රබර්/කරදමුංගු සිටවිමේ දළ ක්ෂේත්‍ර සටහන***



වැනිලා

කාබනික ද්‍රව්‍ය බහුල ජලය බැස යන ලෝම පසක පරිණත රබර් සමග අතුරු වගාවට සුදුසු බෝගයකි. සිටවා වසර තුනකට පසු මල් හටගැනිම ආරම්භ වන අතර වසර 7-8 දී පමණ උපරිම අස්වැන්නක් ලබාගත හැක.

***වේවැල්***

රබර් ආශ්‍රිත වේවැල් වගාවේ වර්ධනය සහ එහි අස්වැන්න පිලිබඳ පර්යේෂණ දැනට සිදුවෙමින් පවතින අතර පරිණත රබර් සමග වගා කිරිම සඳහා වඩාත් උචිත වේවැල් ප්‍රභේදය මා වේවැල් වේ. රබර් වගා කර වසර 10 - 15 කින් පමණ පසුව වේවැල් වගා කිරිම සුදුසු විය හැකි අතර එවිට රබර් ගලවා ඉවත් කරන විටම වේවැල් අස්වැන්නද නෙලා ගත හැක.

***ක්ෂේත්‍රයේ සිටවිම***

රබර් පේළි දෙකක් අතර මිටර 3 - 4 පරතරයෙන් තනි පේලියට වේවැල් සිටවිය හැක.

**රබර් යටතේ ඇන්තූරියම් මල් වගාව**

ඇන්තූරියම් මල් වගාව ව්‍යාපාරයක් වශයෙන් කරන රබර් වගා කරුවන්ට පරිනත රබර් වගාවේ ඇන්තූරියම් වගා කළ හැක. ඇන්තූරියම් වගාව සඳහා පහත සඳහන් ගුණාංග අවශ්‍යය.

- 21-30 ºC උෂ්ණතව පරාසයක්/70% - 75% අතර ආලෝක පරාසයක්/1750mm වඩා වැඩි වර්ෂාපතනයක්

තෙත් කලාපයේ පරිනත රබර් වගාවන් හී මෙම තත්වයන් පිහිටා ඇත. ඇන්තූරියම් පැල 30cm (1') විෂ්කම්භයෙන් යුත් සිමෙන්ති පෝච්චි වල සිටුවා රබර් පේළි අතර ස්ථාපනය කල යුතුය. බිම ඇන්තූරියම් වගා කල නොහැක්කේ රබර් මුල් ඇන්තූරියම් වලට යොදන පොහොර සඳහා තරඟයක් ඇති වීමෙන් ඇන්තූරියම් වගාව අඩපණ වන නිසාය.


**වගා කළ හැකි ප්‍රභේද**

"ට්‍රොපිකල් රෙඩ්" විශේෂය රබර් වගාව යටතේ හොඳින් වර්ධන වීම සහ මල් පිපීම සඳහා සුදුසු ම විශේෂයයි.

***ක්ෂේත්‍රයේ සිටවීම***

8' x 27' (2.4m x 8.1m) දුර යටතේ වවන ලද රබර් වගාවක රබර් පේළි දෙක අතර පෝච්චි පේළි 8ක් තැබිය හැක. රබර් පේළියේ සිට 2m දුරින් පළවෙනි පෝච්චි පේළිය ආරම්භ කල හැක. ඇන්තූරියම් පෝච්චි පේළි 4 කට පසු 0.6m (2') ක තීරුවක් ඇවිදීම සඳහා ඉඩ තබා නැවත පේළි 4ක් ස්ථාපනය කළ හැකිය. ඇන්තූරියම් පෝච්චි 2ක් සහ පේළි 2ක් අතර 0.15m (1/2') දුරකින් ඇසිරිය හැක (රූපය 10).

**රබර්/ඇන්තූරියම් සිටවීමේ දළ ක්ෂේත්‍ර සටහන**




R= **රබර්**

A= **ඇන්තූරියම් පැළ** 30cm (12") **සහිත විෂ්කම්භයෙන් යුත් සිමෙන්ති පෝච්චි**

රබර් වල ජීවන චක්‍රය පුරා වැවිය හැකි අතුරුබෝග

පරිණත රබර් වගාවක යටි වගාවට ලැබෙන ආලෝකය මඳ බැවින් සෙවණේ වගා කළහැකි බෝග තෝරාගත යුතු වේ. කෙසේ වුවද වැඩි ආර්ථික වාසි තකා ආලෝකය අවශ්‍ය කරන බෝග තෝරන්නේ නම් වැඩි ආලෝකයක් ලැබෙන පරිදි අක්කරයක සිටවනු ලබන රබර් පැළ ප්‍රමාණය අඩු කළ යුතුය. මේ සඳහා පේළි අතර පරතරය වැඩි කිරීම සිදු කරනු ලැබේ.

***ඒකීය ක්ෂේත්‍රයක වැවිය හැකි රබර් පැළ ප්‍රමාණය අඩු නොකරම සෙවණේ වැවිය හැකි බෝග***

(උදා. රබර් වවන පරතරය මීටර 2.4 × 8.1 (8' x 27')

***කෝපි***

වැඩි ආදායමක් ලබාගත හැකි බෝගයක් ලෙස සැලකේ. විවිධ දේශගුණික කලාපවල වැවිය හැකි වැදගත් ප්‍රභේද 3ක් හඳුනාගෙන ඇත. pH 6.5 ක් වු ආම්ලික පසක් සුදුසු වේ. එම නිසා රබර් වගා කරන අධි ආම්ලික පසට හුණු එකතු කිරීම අවශ්‍ය විය හැක.

***වගාකල හැකි ප්‍රභේද***

*Coffea arabica* (ඇරබිකා කෝපි) සිසිල් දේශගුණයක් ඇති ඉහළ උන්නතාංශයක් ඇති ප්‍රදේශ වලටද සුදුසු වේ. කෙසේවුවද සාමාන්‍යයෙන් මුහුදු මට්ටමේ සිට මීටර 1800 උස ප්‍රදේශ දක්වා බහුලව වගා කළහැක. මෙම කෝපිවල සුපිරි ගුණාංග නිසා ඉහළ මිලක් ලබා ගත හැක.

*Coffea canephora* (රොබස්ටා කෝපි): පහත රට තෙත් කලාපයට සුදුසු වේ. අඩු උන්නතාංශයක් සහිත උණුසුම් සහ තෙතමනය ඇති ප්‍රදේශ වල වැවේ. ක්ෂණික කෝපි නිෂ්පාදනය සඳහා බහුලව යොදා ගනී.


*Coffea liberica:* විවිධ පාංශු තත්ත්වයන් යටතේ උණුසුම් තෙත් ප්‍රදේශ වල වැවේ. විශාල තද ඵල හට ගන්නා නිසා සැකසුම් වියදම අධික වේ. තිත්ත රසයක් ඇති අතර මැලේසියාව සහ අරාබියානු ජාතිකයින් විශේෂයෙන් ප්‍රිය කරයි.

**ක්ෂේත්‍රයේ සිටවීම**

***රබර් පේළි දෙකක් අතර තනි පේළියට හෝ පේළි දෙකකට මීටර 2.5 × 2.5 පරතරයෙන් කෝපි සිටවිය හැක. මෙහිදි තනි කඳක් සිටින සේ කප්පාදු කළ හැක. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අනුව කඳන් දෙකක් පුහුණු කරන්නේ නම් පරතරය***

මීටර 3 × 3  (10’ × 10’) විය යුතු වේ. කෝපි සඳහා අවශ්‍ය සෙවණ සැපයීම සඳහා  රබර්/ කෙසෙල් වගා කිරීමෙන් අමතර ආර්ථික වාසිද ලබා ගත හැක.

**රබර්/කෝපි සිටවීමේ දළ ක්ෂේත්‍ර සටහන**




***කොකෝවා***

වියළි දේශගුණයක් ඇති දිස්ත්‍රික්ක වල රබර් සමග  ස්ථිර අතුරු බෝගයක් ලෙස කොකෝ වැවිය හැක. pH 6.0 - 6.5, කාබනික ද්‍රව්‍ය බහුලව ඇති ජලය හොඳින් බැසයන මැටි ලෝම පස මෙම බෝගය සඳහා ඉතා යෝග්‍යවේ. මල් හට ගන්නා කාලයේදි පරාගනය වැඩි කිරීමට අධික ආර්ද්‍රතාවයක් තිබීම ඉතා වැදගත්ය. මුහුදු මට්ටමින් මීටර 600 ක් දක්වා බිම්වල හොඳින් වර්ධනය වේ. මේ වගාව සඳහා වාර්ෂිකව වර්ෂාපතනය මි.මි. 1650 - 2750 අතර පැතිරී පැවතිය යුතු අතර, උෂ්ණත්ව සෙල්සියස් $24^0$ - $27^0$ අතර විය යුතු වේ.

***වගාකල හැකි ප්‍රභේද***

| | |
|---|---|
| ක්‍රියලෝ | ඇට සුදට හුරු කහ පැහැයක් ගනී. ඉතා රසවත්ය. අස්වනු අඩුය. රෝග වලට පාත්‍රවීමේ හැකියාව වැඩිය. |
| ෆොරෙසට්‍රියෝ | ඇට තද දම් පැහැයක් ගනී. හොඳින් ඵල හට ගනී. රෝග වලට ඔරොත්තු දෙයි. |
| ට්‍රිනිටාරියෝ | ඉහත වර්ග දෙකේ සංකලනයක් නිසා අතරමැදි ලක්ෂණ පෙන්වයි. |

*ක්ෂේත්‍රයේ සිටවීම*

රබර් පේළි දෙකක් අතර මිටර 3 පරතරය ඇතිව කොකෝ තනි පේළියට සිටවනු ලැබේ. සිටවන වලක් සෙ.මි. 45 × 45 × 45 විය යුතුය. ගසක් නඩත්තු කිරීමේදී අතු තනි ස්ථරයක් සිටින සේ නඩත්තු කළ යුතුවේ. අධික සෙවණ තත්ත්වවලදී ඵල මැලවීමකට බඳුන් වන අතර, එය ප්‍රභාසංස්ලේෂණය අවම වීමෙන් ඇතිවන අසාමාන්‍යතාවයකි.

***ක්ෂේත්‍රයක සිටවිය හැකි රබර් පැළ ප්‍රමාණය අඩු කර (ඝනත්වය අඩු කර) වගාකර හැකි අතුරුබෝග***

රබර් පර්යේෂණායතනය මගින් යෝජිත තනි පේළි සහ දෙපේළි අඩු ඝනත්ව රබර් වගා කිරීමේ ක්‍රම අතුරුබෝග සඳහා වඩාත් හොඳ අවකාශයක් හා ආලෝකයක් ලබා දේ.

***තනි පේළියට සිටවීම***

රබර් මිටර 2.4 × 12 පරතරයට වගා කලවිට සිටවිය හැකි රබර් පැල ගණන සාමාන්‍ය සංඛ්‍යාවෙන් 70% ක් පමණ වේ.

***ද්විත්ව පේළි ක්‍රමයට සිටවීම***

රබර් ද්විත්ව පේළිය තුල සිටවන පරතරය මිටර 2.7 × 2.7 හෝ මිටර 3 × 3 වන අතර ද්විත්ව පේළි අතර පරතරය මිටර 18 ක් වේ. මිටර 2.7 × 2.7 පරතරයට සිට වීමේදි රබර් ඝනත්වය තනි පේලි ක්‍රමයට සමාන මුත් මිටර 3 × 3 පරතරයට සිටවනවිට රබර් ඝනත්වය තනි රබර් වගාවකින් 63% ක් පමණ වේ. ද්විත්ව පේළි ක්‍රමයේදි යහපත් ආලෝක තත්ත්වය නිසා තනි පේළි ක්‍රමයට වඩා වාසිදායක වේ. කුඩා ඉඩම් හිමියන්ගේ ඉඩමේ ප්‍රමාණය කුඩා බැවින් මෙය ප්‍රායෝගිකව කිරීම අපහසු වේ.

***තේ***

රබර් සහ තේ යන බෝග දෙකම වගා කරන තෙත් ප්‍රදේශවල රබර් සමග වගා කිරීමට සුදුසු අතුරුබෝගයකි තේ. මෙය වඩාත් ප්‍රචලිත වි ඇත්තේ කුඩා ඉඩම් හිමියන් අතරය. සාමාන්‍යයෙන් වර්ෂා කාලයේදි රබර් කිරි කැපීමට නොහැකි වුවත් තේ දළු අලෙවියෙන් ආදායමක් ලබාගත හැක. එසේම විශාල වතුයායවල කම්කරුවනගේ රැකියා අවස්ථාවන් මෙන්ම රැකියා සුරක්ෂිතභාවයද ඇති කරන අතුරුබෝගයකි. මෙම බෝග දෙකෙහි මිල ගණන් එකවරකදි පහළ නොයන නිසා තිරසාර ආර්ථිකයක්ද හිමි වේ. තද වියළි කාලවලදි රබර් මගින් තේ සඳහා අවශ්‍ය සෙවණද සපයයි.

*ක්ෂේත්‍රයේ සිටවීම*

රබර්, මිටර 2.4 × 12 පරතරයෙන් තනි පේළියට සිටවන විට ඒ අතර තේ පේළි හතක් සිටවිය හැක. පේළියක් තුල තේ ගස් දෙකක් අතර දුර මිටර 0.6 ද. තේ පේළි දෙකක් අතර පරතරය 1.2 ක් ද වේ. එසේම රබර් සහ තේ පේළි අතර මිටර 2.4 පරතරයක් පවත්වාගත යුතු වේ. ද්විත්ව පේළි ක්‍රමයේදී මෙම පරතරය ඇතිව තේ පේළි දොළහක් (12) යෙදිය හැක. තනි පේළි ක්‍රමයේදී මුළු වගා ප්‍රමාණයෙන් 70% තේ වගා කළ හැක. ද්විත්ව පේළි ක්‍රමයේදී එය 69.5% - 68.5% වේ (රබර් ද්විත්ව පේළි ක්‍රමයේ පරතරය මිටර 2.7 × 2.7, 3 × 3 මෙන්). අවුරුදු 6 කට පසුව තනි පේළි ක්‍රමයේදී තේ අස්වැන්න අඩුවන බැවින් සාර්ථක අස්වැන්නක් සඳහා රබර් වල වියන 25% ක් අඩු කල හැක. මේ සඳහා රබර් ව්‍යාප්ති නිළධාරීගේ උපදෙස් ලබා ගත යුතුය (රූපය 7).

කාබනික ද්‍රව්‍ය අඩු පසක තේ වැවීමට පෙර අවුරුදු 1½ හෝ 2ක පමණ කාලයක් පස ප්‍රතිස්ථාපනය සඳහා මානා හෝ ගෝතමාලා වැනි ශාක විශේෂයන් වැවීම අවශ්‍ය වේ. පහත රට තෙත් කලාපයට නිර්දේශිත තේ ප්‍රභේද රබර් වගා කරන ප්‍රදේශවල සුදුසු බැවින් මෙම ප්‍රභේද තේ/රබර් වගාවට වඩාත් යෝග්‍ය වේ. රබර් සහ තේ පර්යේෂණායතනයන් මගින් නිර්දේශිත පැළ සිටුවීම හා බෝග පාලන ක්‍රම රබර් හා තේ වගාවට අනුගමනය කළ යුතුය. ආවරණ වගාවන් රබර් ඇති ස්ථානවලට පමණක් සිමා කළ යුතු අතර රබර් වලින් සැලකිය යුතු සෙවණක් ලැබෙන තෙක් *Gliricidia* වැනි තේ වලට සෙවණ දෙන ශාක වැවීම සුදුසු වේ.

***කුරුඳු***

මෑත කාලයේ ස්ථාවර මිලක් පැවති සුළු අපනයන බෝගයකි. විවිධ පාංශු තත්ත්ව යටතේදී මෙන්ම වියලි දේශගුණික තත්ත්වයන් යටතේද වගා කළ හැක. පරිණත රබර් වගාවේ සෙවණ යටතේ වැඩෙන කුරුඳු වල පොත්ත අඩු ඝණකමකින් යුක්ත වන අතර කඳන් දිගින් වැඩි වන නිසා මේ අඩුලුහුඩුකම යම් දුරකට මගහැරී යයි. කුරුඳු තැලිම සඳහා පළපුරුදු කම්කරුවන් ඇති නම් පමණක් රබර් කුරුඳු අතුරුවගාව ඇරඹුම යෝග්‍ය වේ. පැළ සහ පේළි අතර පරතරය රබර්/තේ වගාවේ මෙන්මය (රූපය 8).

***ගම්මිරිස්***

තනි සහ ද්විත්ව පේළි ක්‍රමයට සිටවන ලද රබර් වගාවක මිටර 2.5 × 2.5 පරතරයෙන් යුතුව ගම්මිරිස් පේළි 3-5 දක්වා වගා කළ හැකි අතර ගම්මිරිස් වැල් සඳහා ආධාරක සැපයිය යුතුය. සාමාන්‍යයෙන් ග්ලිරිසීඩියා වැනි ජීව ආධාරක යොදා ගනු ලැබුවද, අජීව ආධාරක යොදා ගත්තේ නම් වැඩි අස්වැන්නක් ලබා ගත හැක. එලෙසම මෙහිදී මීටර 2 × 2 යුතු වැඩි ඝනත්වයකින් ගම්මිරිස් වගා කිරීමට හැකිවීමද විශේෂ වාසියකි. කෙසේ නමුදු ගම්මිරිස් සඳහාද හොඳින් වැඩෙන තෙක් තාවකාලික සෙවණක් සැපයිය යුතුය.

***වෙනත් අතුරු වගා ක්‍රම***

*මායිම් වගාව*

**මහෝගනි, හවරිනුග වැනි දැවමය බෝග රබර් ඉඩම් වල මායිම්වල වගා කළ හැක. තවද මෙම බෝග ආධාරක ලෙස යොදා ගනිමින් ගම්මිරිස් වැනි බෝග වගා කිරීමෙන් අමතර ආදායමක් ද ලබා ගැනිමට හැකියාවක් ඇත.**


*පාළු සිටවීම*

**රබර් වගාවේ රබර් ගාකයක් යම්කිසි හේතුවක් නිසා මිය යාමකට හෝ වෙනත් ආපදාවක් නිසා ඉවත් කිරිමට සිදු වූවිට එම ස්ථානයේ මහෝගනි හෝ පුවක් වැනි බෝගයක් සිට විය හැක.**

**පොහොර යෙදිම හා අනෙකුත් වගා නඩත්තුව**


අදාළ බෝග සඳහා දෙන ලද නිර්දේශ අනුව සිදු කළ යුතුය.

**රබර්/තේ තනි පේළි ක්‍රමය දළ ක්ෂේත්‍ර සටහන**




තේ ප්‍රමාණය – ~70%  රබර් ප්‍රමාණය – ~70%

**රබර්/තේ ද්විත්ව පේළි ක්‍රමය දළ ක්ෂේත්‍ර සටහන**




T – තේ R – රබර් G – ග්ලිරිසිඩියා

තේ ප්‍රමාණය – ~69% රබර් ප්‍රමාණය – ~63-69%

**සත්ත්ව පාලනය**

රබර් වගාවන්හි ව්‍යාප්තව ඇති තෘණ හා අනෙකුත් පැළෑටි වර්ග උපයෝගී කරගෙන සත්ත්ව පාලනය කිරීමේ හැකියාව යම් යම් බාධක නිසා සීමා වී පැවතියද, නිදැලි ක්‍රමයට කුකුළන් ඇතිකිරීම කුඩා රබර් වතු හිමියන් සඳහා සුදුසු බව අධ්‍යයන වලින් හෙළි වී ඇත (රූපය 9).

පශු පර්යේෂණ ආයතනය CPRS Brown (Central Poultry Research Station-Brown) දර්ශය ගම් කුකුළන් සමඟ මුහුම් කිරීමෙන් ලබාගත් පළමුවන පරම්පරාව නැවත ගම් කුකුළන් සමඟ මුහුම්කර ලබාගත් දර්ශය නිදැලි ක්‍රමයට සුදුසු දර්ශයක් ලෙස හඳුන්වා දී ඇත.

වැඩි බිත්තර ප්‍රමාණයක් (ගම් කුකුළන්ට සාපේකෂව) ලබා දීමට හැකිවීම සහ පරිසරයට අනුවර්තනය වීමේ වැඩි හැකියාවක් (CPRS brown දර්ශයට සාපේක්ෂව) සහිතව හඳුන්වා දුන් මෙම දර්ශය, පරිනත රබර් වගාව තුළ නිදැලි ක්‍රමයට ඇතිකිරීමෙන් ද සාර්ථක ප්‍රතිඵල ලබා දෙන බව ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය කළ මූලික පරීක්ෂණ වලින් හෙළිවී ඇත. තවද මෙමඟින් රබර් වගාවේ සහ පවතින ස්වාභාවික පැළවල සංයුතියට බාධාවක් ඇති නොකෙරේ.

අක්කර 1/2 සිට අක්කරයක භූමි ප්‍රමාණයක් ඇති ඉඩමේම පදිංචිව සිටින කුඩා ඉඩම් හිමියන්ට මෙම ක්‍රමය සුදුසු වේ. අක්කර 1/2 ක ඉඩමකට කුකුළන් 25ක් හඳුන්වා දිය හැකි අතර මේ සඳහා 7' X 4' කුඩු 3ක් ස්ථාපිත කළ යුතුයි. කෑම බඳුන් හා වතුර මෙම කුඩු තුල තැබිය හැකි අතර රාත්‍රි කාලයට ආරක්ෂාවද සැපයිය හැක.












**උපයෝගීතා පර්යේෂණ අංශය**

**ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය**

**ඩාර්ටන්ෆීල්ඩ්**

**අගලවත්ත**

2014 පෙබරවාරි